## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# අභිලාෂය ප්‍රකාශ කිරීමයි (EOI)

# ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය

| | |
|---|---|
| දිනය | 2024.05.19 |
| ශීර්ෂය | කොළඹ නගරයෙහි පිහිටි ප්‍රධාන දුම්රිය ස්ථාන ගොඩනැගිලි වාණිජ මධ්‍යස්ථාන ලෙස නිර්මාණය කිරීම, ඉදිකිරීම, අරමුදල් සැපයීම, පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදුකිරීම (DBFOM) ප්‍රසම්පාදනය සඳහා යෝජනා සඳහා ඉල්ලීම (RFP) |
| යෝජනා ඉදිරිපත් කළ හැකි අවසන් දිනය හා වේලාව. | 2024.07.15 දින 14.00 පැය (ශ්‍රී ලංකාවේ සම්මත වේලාවෙන්) |

1. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ("සේවායෝජක") විසින්, සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින්, කොළඹ නගරයේ පිහිටි ප්‍රධාන දුම්රිය ස්ථාන ගොඩනැගිලි වානිජ මධ්‍යස්ථාන ලෙස නිර්මාණය කිරීම, ඉදිකිරීම, අරමුදල් සැපයීම, පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදුකිරීම (DBFOM) සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මුද්‍රා තැබූ යෝජනා කැඳවනු ලැබේ. අදාල කොන්ත්‍රාත්තුව, මූලිකව, අවම වශයෙන් වසර තිහක (30) කාලයක් සඳහා වේ.

**ව්‍යාපෘති පරිදර්ශනය**

හඳුනාගත් සංකීර්ණ අතරට රටෙහි වාණිජ මධ්‍යස්ථාන කේන්ද්‍රය බඳු ස්ථානවල පිහිටි කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, ගල්කිස්ස හා කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථාන ඇතුලත් වන අතර, එම දුම්රිය ස්ථාන හරහා දුම්රිය 100 මගින් දුම්රිය මගීන් 10,000 පමණ ගමන් කරයි. උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් ඉහත හඳුනාගත් ස්ථාන හයට අමතරව ඉන් පිටත දුම්රිය ස්ථානද සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කළ හැක.

මෙකී හඳුනාගත් දුම්රිය ස්ථාන නවීන වානිජ හා ප්‍රජා කේන්ද්‍රස්ථාන ලෙසට සංවර්ධනය කිරීමෙන්, මගී ජනතාවගේ පහසුව හා සංකීර්ණවල පවත්නා පහසුකම් වර්ධනය සහ නගරාශ්‍රිත ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ වැඩි දියුණුවක්ද සිදුවනු ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය සේවය හා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින්, මෙම විශේෂ අවස්ථා මූලාරම්භයේ කොටස්කරුවන් වෙමින් ආකර්ෂණීය ප්‍රතිලාභ ලබාගන්නා අතරම, අදාල හවුල්කාරිත්වය තුලින් වැදගත් කොළඹ නගරය වෙත සුනිත්‍ය නාගරික සංවර්ධනයක් ලගාකර දීම සඳහා ආරාධනා කරයි.

**කාර්යයේ විෂය පථය**

අදල කාර්ය විෂය පථයට, කොළඹ නගරයේ පිහිටි ප්‍රධාන දුම්රිය ස්ථාන ගොඩනැගිලි වාණිජ මධ්‍යස්ථාන වශයෙන් නිර්මාණය, ඉදිකිරීම, අරමුදල් සැපයීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම (DBFOM) යන කටයුතු රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වව වැඩපිළිවෙලක් තුලින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අරමුණු කොටගත් ක්‍රියාකාරකම් හා වගකීම් පරිපූර්ණ දමයක් අයත් වේ. එම ක්‍රියාදමයට පහත සඳහන් කරුණු වෙනත් කරුණුවලට අමතරව අයත්වේ.

1. නිර්මාණය හා සැලසුම් : ලංසුකරු විසින් සංකල්පමය සංවර්ධන සැලසුමක් ඉදිරිපත් කල යුතුය.
2. ඉදිකිරීම/ සංවර්ධනය : ඉදිකිරීම් කටයුතු සම්බන්ධව කෙටි ක්‍රමවේද ප්‍රකාෂයක් ඉදිරිපත් කල යුතුය.
3. පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු : අදල ව්‍යාපෘතිය හෝ සේවාවන් නිම වී ක්‍රියාත්මක තත්ත්වයට ආපසු අපේක්ෂා කරනු ලබන මෙහෙයුම් කාර්ය, කලමනාකරණය, නඩත්තු කටයුතු හා දෛනික මෙහෙයුම් කටයුතු පිළිබඳ විස්තරයක්.
4. අරමුදල් සැපයීම : පෞද්ගලික හවුල්කරු වෙතින් අපේක්ෂිත ආයෝජන අවශ්‍යතා අරමුදල් මාදිලි හෝ මූල්‍ය දායකත්වය ඇතුලත් මූල්‍ය වගකීම පැහැදිලි කල යුතුය.
5. අනුගත වීම් හා ප්‍රමිතීන් : ලංසුකරුවන් විසින් එක් එක් දුම්රිය ස්ථානයක් සඳහා වෙන් වෙන් වශයෙන් යෝජනා ඉදිරිපත් කල යුතු අතර, අදල ව්‍යාපෘති යෝජනා, පවත්නා හා නාගරික සංවර්ධන අධිකාරිය අනෙකුත් සාමාන්‍ය මාර්ගෝපදේශ හා පහතින් දක්වා ඇති නිර්මාණ මාර්ගෝපදේශ මගින් පනවා ඇති රෙගුලාසි මත එක් එක් ස්ථානයක භූමිය පදනම් වූ අපේක්ෂිත සංවර්ධනයට අනුගත විය යුතුය.

2. මෙම ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය : අදල අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලේඛනවල සඳහන් පරිදි සියලු ලංසුකරුවන්හට විවෘතය.

3. පහත සඳහන් ප්‍රධාන නිපුණතා සහිත සුදුසුකම්ලත් ලංසුකරුවන් පමණක් මෙම ලංසුකරණයට සහභාගි විය යුතුය.

   i. මෙම ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා ලංසුකරුවන් තම මූල්‍ය හා තාක්ෂණික හැකියාවන් සනාථ කල යුතුය.

4. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කල අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලේඛන පරීක්ෂා කොට බැලීමත්, මිලදී ගැනීමත් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් පහත සඳහන් අය ඇමතිය යුතුය.

   විමුක්ති පතිරණ මයා, සහකාර අධිකාරී (වානිජ) – වෙළඳ හා අලෙවි කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය.

   **තැ. පෙ. 355, කොළඹ 10.**
   **දුරකථනය : 0775647201, 0114600152**
   **ඊමේල් : vimukthipathirana.slr@gmail.com**
   **වෙබ් අඩවිය : www.railway.gov.lk**

   i. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් දස දහසක් (රුපියල් 10,000.00) ගෙවීමෙන් හා 05 ඡේදය යටතේ සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සාමාන්‍ය රාජකාරී දිනවල 2024.05.20 දින සිට 2024.07.12 දින දක්වා 09.00 පැය හා 15.00 පැය (මෙරට වේලාවෙන්) අතර කාලය තුල උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කල සම්පූර්ණ අභිලාෂය ප්‍රකාශ කිරීම් ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. මෙම දින සම්බන්ධව තවදුරටත් දීර්ඝ කිරීම් සිදු නොකෙරේ.

5. මේ සම්බන්ධ පෙර – ලංසු හමුවක්, 2024.06.10 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II, 7 වන මහලේ, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ කාර්යාලයේ පැවැත්වීමට නියමිතය.

6. අදල යෝජනා පහත සඳහන් ලිපිනය වෙත, 2024.07.15 දින සිට 14.00 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

   **සභාපති, අමාත්‍ය මණ්ඩලය පත්කළ සාකච්ඡා කමිටුව (CANC),**
   **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, 7 වන මහල, සෙත්සිරිපාය අදියර II,**
   **බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**

7. යෝජනා පිළියෙල කිරීමේදී හෝ ලැබීමට සැලැස්වීමේදී ලංසුකරුහට සිදුවිය හැකි යම්පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් අදල ලංසුකරණයේ ප්‍රතිඵල හෝ පැවැත්වීම කෙසේ සිදුවූවද ඒ පිළිබඳ සේවා යෝජක කිසිදු වගකීමක් දරන්නේ නැත.

**සභාපති, අමාත්‍ය මණ්ඩලය පත්කළ සාකච්ඡා කමිටුව,**
**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, 7 වන මහල, සෙත්සිරිපාය අදියර II,**
**බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**
**යොමු අංකය - SRS/F.8023**